# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2417/16 - 2024 දෙසැම්බර් මස 31 වැනි අඟහරුවාදා - 2024.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2013 (ii)

### 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 321 වන වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

බිමල් නිරෝෂන් රත්නායක,
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. (1) මේ නියෝග 2024 අංක 3 දරන වෙළඳ නැව් (යාත්‍රා වර්ගීකරණය කිරීමේ සහ සහතික කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

   (2) මේ නියෝග ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද සියලුම යාත්‍රා සඳහා අදාළ වන්නේ ය.

2. යාත්‍රාවල ප්‍රවාහනය කරන භාණ්ඩ, යාත්‍රා මගින් සිදු කරන මෙහෙයුම්, අපේක්ෂිත භාවිතය සහ යාත්‍රාවේ වර්ගය යන කරුණු මත පදනම්ව ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද සියලුම යාත්‍රා කාණ්ඩ ලෙස වර්ගීකරණය කළ යුතු ය. යාත්‍රා වර්ගීකරණයන් පහත පරිදි වේ:-


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) 1 වන කාණ්ඩය - මගී යාත්‍රා

(ආ) 2 වන කාණ්ඩය - බඩු යාත්‍රා

(ඇ) 3 වන කාණ්ඩය - ක්‍රීඩා හෝ විනෝදය සඳහා වාණිජ වශයෙන් භාවිත කරන යාත්‍රා

(ඈ) 4 වන කාණ්ඩය - ක්‍රීඩා හෝ විනෝදය සඳහා පෞද්ගලික වශයෙන් භාවිතා කරන යාත්‍රා (කුළියට ගැනීම සඳහා නොව)

(ඉ) 5 වන කාණ්ඩය - කාර්ය බෝට්ටු

(ඊ) 6 වන කාණ්ඩය - නියමු බෝට්ටු

3. ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි සම්මුතීය නොවන සියලුම යාත්‍රා සඳහා 2024 දෙසැම්බර් 31 දිනැති අංක 2417/15 දරන *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 2024 අංක 2 දරන වෙළඳ නැව් (ජල තීරයන් වර්ගීකරණ කිරීමේ) නියෝගවලට අනුකූලව, මෙහෙයුම් ප්‍රදේශ පවරා දිය යුතු අතර පහත ලැයිස්තුගත කර ඇති පරිදි අදාළ තාක්ෂණික ක්ෂේත්‍රයන්හි නිශ්චිතව දක්වා ඇති සැලසුම් කාණ්ඩ සමඟ ඒකාබද්ධව සහ සැලසුම් පිළිබඳ සමාලෝචනයට අනුව, මෙහෙයුම් ප්‍රදේශ පවරා දිය යුතු යː-

(අ) අභ්‍යන්තර ජලතීර රුවල් නැව් ක්ෂේත්‍රය;

(ආ) කුඩා රුවල් නැව් ක්ෂේත්‍රය (දිග මී. 24 දක්වා);

(ඇ) විශාල සම්මුතීය නොවන රුවල් නැව් ක්ෂේත්‍රය (දිග මීටර් 24 ට වැඩි); සහ

(ඈ) විශාල යාත්‍රා ක්ෂේත්‍රය (දිග මී. 24 ට වැඩි)

4. (1) මේ නියෝග අදාළ වන සම්මුතීය නොවන යාත්‍රා පරීක්ෂා කිරීම සහ ඒවා පිළිබඳ සමීක්ෂණය කිරීම වෙළඳ නැව් (මේ නියෝගවල "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" ලෙස සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සිදු කළ යුතු ය.

(2) මේ නියෝගවල සඳහන් සහතික අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන සහ (2) වන උප නියෝගවල කාර්යය සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගත් සංවිධාන වෙත හෝ සහතික කිරීමේ ආයතන වෙත එකී බලය පවරනු ලැබිය හැකි ය.

(4) ශ්‍රී ලංකාවේ වරායවල් වෙත පිවිසෙන විදේශ රටවල දී ලියාපදිංචි කරන ලද සම්මුතීය නොවන යාත්‍රාවලට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගත හැකි සමාන සහතිකයක් තිබිය යුතු ය.

5. (1) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි සහ හුදෙක් ම ශ්‍රී ලංකා ජල තීරයේ මෙහෙයුම් සිදු කරන සම්මුතීය නොවන සියලුම යාත්‍රාවලට මෙහි උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි නිශ්චිත යාත්‍රා කාණ්ඩයට අදාළ සහතිකයක් සහ මෙහෙයුම් සිදු කිරීමට අදහස් කරන ප්‍රදේශයක් තිබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි සහ ජාත්‍යන්තර මුහුදු ගමන්වල නිරත වන සම්මුතීය නොවන සියලුම යාත්‍රාවලට (1) වන උප නියෝගයට අනුව සහතිකයක් සහ ඊට අමතරව පහත දැක්වෙන දේ තිබිය යුතු යː-

(අ) අදාළ ජාත්‍යන්තර සම්මුතිවලට හෝ සම්මුතිවල කොටස්වලට අනුව යාත්‍රාවේ දළ ටොන් ප්‍රමාණයට ඃ හෝ

(ආ) සුදුසු නිදහස් කිරීමක් හෝ තනි මුහුදු ගමන් සහතිකයක්.

6. බහුකාර්ය භාවිතය සඳහා අපේක්ෂිත සම්මුතීය නොවන යාත්‍රා අදාළ නියෝගවලට අනුකූල විය යුතු අතර එම යාත්‍රාවල මෙහි උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති අදාළ සහතිකය තිබීම අවශ්‍ය වේ.

7. සම්මුතීය නොවන යාත්‍රා හැර අනෙකුත් සියලුම යාත්‍රා අදාළ ජාත්‍යන්තර සම්මුතිවල සහතික කිරීමේ අවශ්‍යතා සපුරා තිබිය යුතු ය.

8. (1) මේ නියෝගවල විධිවිධානවලට අනුකූල වීම ප්‍රායෝගික නොවන බවට හෝ සාධාරණ නොවන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සෑහීමකට පත් වේ නම්, ඔහු විසින් සම්මුතීය නොවන යම් යාත්‍රාවක් මේ නියෝගවල නියමයන්ගෙන් නිදහස් කරනු ලැබිය හැකි ය. ඒ පිළිබඳ විස්තර සහ ඒ සඳහා වන හේතු නිදහස් කිරීමේ සහතිකයේ නිශ්චිතව දැක්විය යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සාධාරණ දැනුම්දීමක් ලබා දීමට යටත්ව, එවැනි යම් නිදහස් කිරීමක් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

9. මේ නියෝගවල -

"බෝට්ටුව" යන්නෙන්, දිගින් මීටර් 24 කට අඩු යාත්‍රාවක් හෝ දළ ටොන් බර 150 කට අඩු යාත්‍රාවක් අදහස් වේ. බෝට්ටුව, බෝට්ටුවක්, වායු පිරවූ වාහනයක්, රුවල් බෝට්ටුවක්, සුළං පිරවිය හැකි බෝට්ටුවක් විය හැකි ය;

"බඩු" යන්නෙන්, බෝට්ටුව සඳහා වන ඉන්ධන, පිරවුම් ද්‍රව්‍ය (ඝන හෝ දියර), නැවේ දී භාවිතා කරනු ලබන පරිභෝජනය කළ හැකි දේ, බෝට්ටුවේ ස්ථිර මෙවළම් කට්ටලය සහ උපකරණ, බෝට්ටුවේ ගබඩාවන් සහ අමතර ගියරය, කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පුද්ගලික ගමන් මළු, මගීන් සහ ඔවුන්ගේ පුද්ගලික ගමන් මළු සහ කාර්යයන්ට අදාළ උපකරණ හැර බෝට්ටුවේ ප්‍රවාහනය කරනු ලබන සියලු දේ අදහස් වේ;

"නැව් බඩු යාත්‍රාව" යන්නෙන්, මගී නෞකාවක් නොවන ඕනෑම යාත්‍රාවක් අදහස් වේ;

"සහතික කිරීමේ ආයතන" යන්නෙන්, සම්මුතීය නොවන යාත්‍රා සමීක්ෂණය කිරීමේ, පරීක්ෂා කිරීමේ සහ සහතික කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගත් සහ බලපත්‍රලාභී සමාග මක් හෝ වෘත්තිය සංවිධානයක් අදහස් වේ;

"රුවල් නැව" යන්නට, නැව යන්නෙහි අර්ථයම ඇත්තේ ය;

"දේශීය මුහුදු ගමන" යන්නෙන්, ශ්‍රී ලංකාවේ වරායකින් හෝ ස්ථානයකින් එම වරායටම හෝ එම ස්ථානයට ම හෝ ශ්‍රී ලංකාවේ වෙනත් වරායකට හෝ ස්ථානයකට යන මුහුදු ගමනක් අදහස් වේ;

"පාරුව" යන්නෙන් පර්යන්ත අතර, ගංගාවක් හෝ සාපේක්ෂව කුඩා වෙනත් ජල ප්‍රදේශයක් හරහා මගීන්, මෝටර් රථ සහ වාණිජ පදනම මත බඩු රැගෙන යාමට භාවිතා කරන යාත්‍රාවක් අදහස් වේ;

"දළ ටොන් (GT) යන්නට, 1969 නැව්වල ටොන් මිනුම්කරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය මගින් දී ඇති අර්ථය ම සහ ටොන් සහතිකයේ සඳහන් කර ඇති අර්ථය ම ඇත්තේ ය;

"දිග" යන්නෙන්, නැව් තලයේ ඉහළ සිට මනිනු ලබන අඩුම හැඩකළ ගැඹුරින් සියයට 85 ක දී පවතින ජල මාර්ගයක මුළු දිගින් සියයට 96 ක් හෝ එම ජල මාර්ගයේ කඳේ ඉදිරිපස සිට සුක්කානම් අක්ෂය දක්වා දිග යන දෙකෙන් වඩා වැඩි දිග අදහස් වේ. නැව් තලයේ ආනතියක් සහිතව සැලසුම් කර ඇති බෝට්ටුවක, මෙම දිග මනිනු ලබන ජල මාර්ගය, සැලසුමේ ජල මාර්ගයට සමාන්තර විය යුතු ය;

"නාවික සැතපුම" යන්නෙන්, මීටර් 1852 ක් අදහස් වේ;

"සම්මුතීය නොවන යාත්‍රා" යන්නෙන්, ජාත්‍යන්තර සම්මුතීන් අදාළ නොවන යාත්‍රා සහ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, යාත්‍රාවේ දළ ටොන් ප්‍රමාණය හේතුවෙන් අදාළ වන, අදාළ ජාත්‍යන්තර සම්මුතීන්ගෙන් නිදහස් කිරීමක් ප්‍රදානය කර ඇති හුදෙක් දේශීය මුහුදු ගමන්වල පමණක් නිරත වන යාත්‍රා අදහස් වේ. යාත්‍රාවේ දළ ටොන් ප්‍රමාණය හෝ මෙහෙයුම් ප්‍රදේශය හේතුවෙන් ජාත්‍යන්තර සම්මුතීන්වල කොටස් අදාළ වන අවස්ථාවක, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිදහස් කිරීම් ප්‍රදානය කරනු ලැබ ඇත්නම් මිස ඒවා අදාළ විය යුතු ය;

"මගී යාත්‍රාව" යන්නෙන්, මගීන් දොළහකට වඩා වැඩි සංඛ්‍යාවක් රැගෙන යනු ලබන නැවක් අදහස් වේ;

"නියමු බෝට්ටු" යන්නෙන් නියමු සේවාවල නිරත වන හෝ නිරත වීමට අපේක්ෂා කරන බෝට්ටු අදහස් වන අතර, 'කැපවූ නියමු බෝට්ටු' යන්නෙන් මූලික වශයෙන් නියමු සේවාවල නිරත වන සහ සේවක පිරිස, ලියුම් සහ කුඩා ප්‍රමාණයේ බඩු නියමු දිස්ත්‍රික්ක තුළ බෝට්ටු වෙත හෝ බෝට්ටුවලින් ප්‍රවාහනය කිරීම වැනි අවස්ථානුගත වෙනත් සේවාවල නිරත වන කුමන හෝ ප්‍රමාණයේ පයිලට් බෝට්ටු අදහස් වේ;

"පිළිගත් සංවිධානය" යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය විසින් සම්මත කරනු ලැබූ පිළිගත් සංවිධාන සඳහා වන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගනු ලැබ ඇති යම් සංවිධානයක් අදහස් වේ;

"ලියාපදිංචි කිරීම" යන්නෙන්, යාත්‍රාවක් ශ්‍රී ලංකා වරාය හා නාවික අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය අදහස් වේ;

"නැව" යන්නෙන්, දිගින් මීටර් 24 වැඩි ජල වාහක යාත්‍රාවක් හෝ දළ ටොන් ප්‍රමාණය 150 ට වැඩි යාත්‍රාවක් අදහස් වේ;

"යාත්‍රාව" යන්නෙන්, මේ නියෝග මගින් අර්ථ දක්වා ඇති බෝට්ටුවක් හෝ නැවක් අදහස් වේ;

"යාත්‍රා වර්ග" යන්නෙන්, මේ නියෝග මඟින් අර්ථ දක්වා ඇති ආකාරයට එහි අපේක්ෂිත භාවිතය අනුව එකී බෝට්ටුව හෝ නැව වර්ග කිරීම අනුකූලව අදහස් වේ;

"කාර්ය බෝට්ටුව" යන්නෙන්, ක්‍රීඩා හෝ විනෝදය සඳහා හැර අනෙකුත් කාර්යයන් සඳහා වාණිජ වශයෙන් භාවිත කරන සම්මුතීය නොවන යාත්‍රාවක් අදහස් වන අතර කැපවූ පයිලට් බෝට්ටුව මෙයට ඇතුළත් නොවේ.

### උපලේඛනය

(5(1) වන නියෝගය)

හුදෙක් ශ්‍රී ලංකා ජල තීරයන්හි යාත්‍රා කරන සම්මුතීය නොවන යාත්‍රා සඳහා අදාළ කේතයන්හි නිශ්චිතව දක්වා ඇති සහ යාත්‍රාවේ ප්‍රමාණය හේතුවෙන් නියම කරන ලද පහත දැක්වෙන සහතිකවලින් සුදුසු සහතික අවශ්‍ය වේ.

1. 1 වන කාණ්ඩය - මගී යාත්‍රා සහතික කිරීම -

(අ) අභ්‍යන්තර ජල තීර රුවල් නැව් කේත සහතිකය - මගී හෝ

(ආ) කුඩා රුවල් නැව් කේත සහතිකය (දිග මී. 24 දක්වා) - මගී හෝ

(ඇ) විශාල සම්මුතීය නොවන රුවල් නැව් කේත සහතිකය (දිග මී. 24 ට වැඩි) - මගී

(ඈ) ටොන් ප්‍රමාණ සහතිකය (යාත්‍රාව මී. 24 ට වැඩි නම්)

(ඉ) පැටවුම් රේඛා සහතිකය - මී. 24 ට වැඩි අලුත් යාත්‍රා සහ (1972 ජනවාරි මාසයට පෙර සාදන ලද) දළ ටොන් ප්‍රමාණය 150 ට වැඩි දැනට පවතින යාත්‍රා සඳහා අවශ්‍ය වේ.

(ඊ) ආරක්ෂාකාරී ගුවන් විදුලි සහතිකය - දළ ටොන් ප්‍රමාණය 300 ට වැඩි යාත්‍රා

2. 2 වන කාණ්ඩය - බඩු යාත්‍රා සහතික කිරීම -

- අභ්‍යන්තර ජල තීර රුවල් නැව් ක්ෂේත්‍ර සහතිකය - මගී නොවන හෝ
- කුඩා රුවල් නැව් ක්ෂේත්‍ර සහතිකය (දිග මී. 24 දක්වා) - මගී නොවන හෝ
- විශාල සම්මුතීය නොවන රුවල් නැව් ක්ෂේත්‍ර සහතිකය (දිග මී. 24 ට වැඩි) - මගී නොවන
- ටොන් ප්‍රමාණ සහතිකය (යාත්‍රාව මී. 24 ට වැඩි නම්)
- පැටවුම් රේඛා සහතිකය - මී. 24 ට වැඩි අලුත් යාත්‍රා සහ (1972 ජනවාරි මාසයට පෙර සාදන ලද) දළ ටොන් ප්‍රමාණය 150 ට වැඩි දැනට පවතින යාත්‍රා සඳහා අවශ්‍ය වේ.
- ආරක්ෂාකාරී ගුවන් විදුලි සහතිකය - දළ ටොන් ප්‍රමාණය 300 ට වැඩි යාත්‍රා
- යෝග්‍යතා සහතිකය (රසායනික ද්‍රව්‍ය හෝ වායු) - රසායනික ද්‍රව්‍ය ටැංකි හෝ වායු ප්‍රවාහක සඳහා
- අන්තරාදායක භාණ්ඩ ප්‍රවාහනය කරන නෞකා සඳහා වන විශේෂ නියමයන්ට අනුකූලවන ලේඛනය (IMDG සංග්‍රහය)

3. 3 වන කාණ්ඩය - ක්‍රීඩා හෝ විනෝදය සඳහා වාණිජ වශයෙන් භාවිත කරන යාත්‍රා සහතික කිරීම.

- අභ්‍යන්තර ජල තීර රුවල් නැව් ක්ෂේත්‍ර සහතිකය හෝ
- කුඩා රුවල් නැව් ක්ෂේත්‍ර සහතිකය (දිග මී. 24 දක්වා) හෝ
- විශාල සම්මුතීය නොවන රුවල් නැව් ක්ෂේත්‍ර සහතිකය (දිග මී. 24 ට වැඩි)
- ටොන් ප්‍රමාණ සහතිකය (යාත්‍රාව මී. 24 ට වැඩි නම්)
- පැටවුම් රේඛා සහතිකය - මී. 24 ට වැඩි අලුත් යාත්‍රා සහ (1972 ජනවාරි මාසයට පෙර සාදන ලද) දළ ටොන් ප්‍රමාණය 150 ට වැඩි දැනට පවතින යාත්‍රා සඳහා අවශ්‍ය වේ.
- ආරක්ෂාකාරී ගුවන් විදුලි සහතිකය - දළ ටොන් ප්‍රමාණය 300 ට වැඩි යාත්‍රා

4 4 වන කාණ්ඩය - ක්‍රීඩා හෝ විනෝදය සඳහා පෞද්ගලික වශයෙන් පරිහරණය කරන යාත්‍රා (කුළියට දීම සඳහා නොව) සහතික කිරීම.

- අභ්‍යන්තර ජල තීර රුවල් නැව් කේත සහතිකය හෝ
- කුඩා රුවල් නැව් කේත සහතිකය (දිග මී. 24 දක්වා) හෝ
- විශාල යාත්‍රා කේත සහතිකය (දිග මී. 24 ට වැඩි)
- ටොන් ප්‍රමාණ සහතිකය (යාත්‍රාව මී. 24 ට වැඩි නම්)

ක්‍රීඩා හෝ විනෝදය සඳහා පෞද්ගලික වශයෙන් පරිහරණය කරන සම්මුතිය නොවන යාත්‍රා ස්ව-කැමැත්තෙන් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි නොකරන විට, එම යාත්‍රා සඳහා පහත දැක්වෙන තාක්ෂණික කේතවලින් එකකට අනුකූල වීම පිළිබඳ වලංගු වාර්තාවක් අවශ්‍ය වේ.

- අභ්‍යන්තර ජල තීර රුවල් නැව් කේත අනුකූලතා වාර්තාව
- කුඩා රුවල් නැව් කේත අනුකූල වාර්තාව
- විශාල යාත්‍රා කේත අනුකූලතා වාර්තාව

5. 5 වන කාණ්ඩය - කාර්ය බෝට්ටු සහතික කිරීම.

- අභ්‍යන්තර ජල තීර රුවල් නැව් කේත සහතිකය හෝ
- කුඩා රුවල් නැව් කේත සහතිකය (දිග මී. 24 දක්වා) හෝ
- විශාල සම්මුතිය නොවන රුවල් නැව් කේත සහතිකය (දිග මී. 24 ට වැඩි නම්)
- ටොන් ප්‍රමාණ සහතිකය (යාත්‍රාව මී. 24 ට වැඩි නම්)
- පැටවුම් රේඛා සහතිකය - මී. 24 ට වැඩි අලුත් යාත්‍රා සහ (1972 ජනවාරි මාසයට පෙර සාදන ලද) දළ ටොන් ප්‍රමාණය 150 ට වැඩි දැනට පවතින යාත්‍රා සඳහා අවශ්‍ය වේ.
- ආරක්ෂාකාරී ගුවන් විදුලි සහතිකය - දළ ටොන් ප්‍රමාණය 300 ට වැඩි යාත්‍රා

6. 6 වන කාණ්ඩය - පයිලට් බෝට්ටු සහතික කිරීම.

- අභ්‍යන්තර ජල තීර රුවල් නැව් කේත සහතිකය හෝ
- කුඩා රුවල් නැව් කේත සහතිකය (දිග මී. 24 දක්වා) හෝ

EOG - 01 - 0011

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.